ත්‍රිරෝද රියක් සහ වෑන් රියක් ගැටීමෙන් සිදු වූ හදිසි අනතුරකින්, තිදෙනෙකු තුවාල ලබා, එක් අයෙකු මිය යෑමේ සිදුවීම, දිනමිණ සහ ලංකාදීප පුවත්පත් (ජූනි 12, 2023) තුළ වාර්තා වී තිබුණේ තිබුණේ මෙසේය.

* "කාන්තාවක පැදවූ ත්‍රිරෝද රිය වෑන් රියක ගැටී මරණ 1යි" - දිනමිණ

* "කාන්තාවක් පැදවූ ත්‍රිරෝදය වෑන් රියක හැපී කතක් මරුට" - ලංකාදීප

1) රිය අනතුරු සම්බන්ධයෙන් පළ වන වෙනත් පුවත් වාර්තාවන් හා මෙම වාර්තාවන් සැසඳීමේදී, පුරුෂ පාර්ශවයේ අයෙකු සම්බන්ධ වන මෙවැනි සිදුවීමකදී එසේ විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ භාවය සඳහන් කිරීමක් දක්නට ලැබෙන්නේ ද?

2) කාන්තාවන් රිය පැදවීම සම්බන්ධයෙන් විවිධ ඒකාකෘතික කිරීම් (stereotypes) තවමත් අප සමාජය තුළ පවතින පසුබිමක, මෙම අනතුරට ලක් වූ ත්‍රිරෝද රිය "කාන්තාවක්" විසින් පැදවූ බව විශේෂයෙන් ඉස්මතු කොට දැක්වීම අවශ්‍ය වේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!